# ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශවල සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ස්ථානගත කිරීමේදී සලකා බලන සාධක පිළිබඳ අධ්‍යයනක්

**පී. ඩී. සමරසිංහ* සහ කේ. ජී. පී. වීරසිංහ**
*ආර්ථිකවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.*
**Corresponding author:* pdsamarasingha.pds@gmail.com

## හැඳින්වීම

කාර්මික විප්ලවයත් සමඟ සෑම රටක ම ආර්ථික ව්‍යුහය තුළ කර්මාන්ත අංශයේ වැදගත්කම ප්‍රචලිත වීමේ නව ප්‍රවණතාවත් ඇති වූ අතර ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් කර්මාන්ත ස්ථාපිත කිරීම කෙරෙහි ද දැඩි උනන්දුවක් නිර්මාණය විය. කර්මාන්ත ස්ථානගත කිරීම, ආදායම් උපරිමකරණ හා පිරිවැය අවමකරණය හෙවත් ලාභ උපරිමකරණ සන්දර්භය තුළ ගොඩනැගේ. එසේම කර්මාන්ත ස්ථාපිත කිරීම සාධක රාශියක එකතුවක් මත ගන්නා තීරණයකි. කර්මාන්ත ස්ථානගත වීම පුළුල් ලෙස ආර්ථික, සමාජීය, භෞතික ආදී විවිධ සාධකයන්ට පිවිසීමේ හැකියාව මත තීරණය වන අතර කර්මාන්ත ස්ථානගත වීම කෙරෙහි බලපාන සාධක රටින් රටට, ප්‍රදේශයෙන් ප්‍රදේශයට, කර්මාන්ත ස්වරූපය අනුව, ග්‍රාමීය හා නාගරික අනුව වෙනස්කම් වේ.

සංවර්ධිත රටවල මෙන් ම සංවර්ධනය වෙමින් පවතින රටවල ද ආර්ථිකයට විශාල දායකත්වයක් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වලින් ලබා දේ. ඒ නිසා නිෂ්පාදන කර්මාන්ත ස්ථානගත කිරීමේ නිර්ණායක පිළිබඳ ව පවතින විවිධ තීරකයන් පිළිබඳ ව විවිධ රටවල් විවිධ පරීක්ෂණ සිදු කර ඇත. කර්මාන්ත ස්ථානගත කිරීමේ සාධකවල මිනුම් (Dimensions of Industrial Location Factors) යන අධ්‍යයනය බද්‍රි (Badri) විසින් 2007 දී සිදු කර ඇත. කර්මාන්තවල විධායක නිලධාරීන්ට ලබාදුන් ප්‍රශ්නාවලියක් මගින් ලබාගත් දත්ත සංඛ්‍යානමය ක්‍රමවේදයන් ඇසුරෙන් විශ්ලේෂණයට ලක් කර ඇති අතර ගෝලීය තරඟකාරිත්වය, විදේශීය රටවල දේශපාලන තත්වය, රාජ්‍ය නීති රීති, ආර්ථික සාධක යන සාධක හා අන්තර්ජාතික වශයෙන් ප්‍රවාහනය, ශ්‍රමය, අමුද්‍රව්‍ය වෙළඳපොළ, කාර්මික භූමිය, රාජ්‍ය ආකල්ප, බදු ව්‍යුහය හා කාලගුණය යන සාධකයන් පොදුවේ සලකා බලන තීරණාත්මක සාධකයන් ලෙස යොදාගෙන ඇත.

රටක් සංවර්ධිත ද ඌණ සංවර්ධිත ද යන්න මත කර්මාන්ත ස්ථානගතවීම විවිධ විය හැකිය. 2008 දී ඩීච්මන් ඇතුළු පිරිස (Deichman et al) සංවර්ධනය වෙමින් පවතින රටවල කර්මාන්ත ස්ථානගතවීම (Industrial Location in Developing Countries) යන අධ්‍යයනය සිදු කර ඇත. සංවර්ධනය වෙමින් පවතින රටවල ආර්ථික වර්ධනයේ දී නිෂ්පාදන කර්මාන්ත අංශය ආර්ථිකය ක්‍රියා කරවන්නක් ලෙස කටයුතු කරන බව දක්වා ඇත. එසේ ම ඉන්දියාවේ නිෂ්පාදන කර්මාන්ත පොකුරුගත වීමේ නිර්ණායකයන් (Determinants of Clusters in Indian Manufacturing) යන අධ්‍යයනය ෆර්නැන්ඩෙස් හා ෂර්මා (Fernandes and Sharma, 2012) විසින් සිදු කර ඇත. මේ මගින් ඉන්දියාවේ කර්මාන්ත පොකුරුගත වීම විශේෂ සාධක කාණ්ඩ 4ක් එනම් යටිතල පහසුකම්වල භූමිකාව, යහපාලනය, අධ්‍යාපනය හා කාර්මික ප්‍රතිපත්ති යටතේ සම්බන්ධ වන ආකාරය හඳුනාගැනීම සඳහා සිදු කරයි.

රටක සංවර්ධනය සඳහා කර්මාන්ත අංශයේ වර්ධනය ඉතා වැදගත් වේ. ශ්‍රී ලංකාවේ පවතින දරිද්‍රතාවය, සේවා වියුක්තිය, ආදායම් ව්‍යාප්ති විෂමතාවය යනාදී ගැටළුවලින් මිදීමට කර්මාන්ත අංශයේ දියුණුව ඉවහල් වේ. විශේෂයෙන් ම නව කර්මාන්ත ස්ථානගත කිරීම තුළින් ඒක පුද්ගල ආදායම ඉහළ ගොස් පුද්ගල ජීවන තත්ත්වය ඉහළ

යයි. නමුත් ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය වශයෙන් කර්මාන්ත අංශයේ දායකත්වයෙහි දැඩි විෂමතාවයක් දැකගත හැකි ය. ග්‍රාමීය අංශ සිය ආදායම් මට්ටම ඉහළ නංවාගෙන ආර්ථික ශක්තිය වර්ධනය කර ගැනීමට කුඩා කර්මාන්ත ස්ථානගත කිරීමට නැඹුරුවක් දක්වන බව පෙනේ. ඒ නිසා ග්‍රාමීය වශයෙන් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ස්ථාපනය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම අගනේ ය.

විශේෂයෙන් ම කුඩා කර්මාන්ත බහුල වශයෙන් ග්‍රාමීය අංශය කේන්ද්‍ර කරගෙන ස්ථානගත වන නිසා එසේ ස්ථානගත වීමේ දී කුමන නිර්ණායකයන් බලපාන්නේ ද යන්න විශ්ලේෂණය කිරීම කාලීන අවශ්‍යතාවකි.

## අධ්‍යයන ක්‍රමවේදය

පර්යේෂණ අරමුණු ඉටු කර ගැනීම සඳහා ප්‍රාථමික දත්ත රැස් කිරීම කුඩා කර්මාන්තකරුවන්ට ලබාදෙන ලද ප්‍රශ්නාවලියක් ආශ්‍රයෙන් සිදු කරන ලදි. නියැදිය තෝරා ගැනීමේ දී 2015 වසරේ ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ලියාපදිංචි වූ ව්‍යාපාර නාම ලේඛනයට ඇතුළත් කුඩා කර්මාන්ත 297ක් අතරින් කර්මාන්ත 60ක් අහඹු ලෙස තෝරාගත් අතර කර්මාන්තයේ ස්වරූපය අනුව දත්ත ලබාගැනීමේ පහසුව සඳහා ආහාර නිෂ්පාදන, ගොඩනැගිලි ද්‍රව්‍ය, පැල තවාන් හා කොහු නිෂ්පාදන, දැව ආශ්‍රිත නිෂ්පාදන හා ඇඟළුම් වශයෙන් ශීර්ෂ පහක් යටතේ කර්මාන්ත තෝරාගැනීම සිදු විය. ව්‍යාපාර නාම ලේඛනයේ බහුල වශයෙන් ලියාපදිංචි වී ඇති කර්මාන්තවලින් වැඩි නියැදි ඒකක ප්‍රමාණයක් නියෝජනය වන පරිදි නියැදිය තෝරාගැනුණි. එසේම නියැදි දත්ත විශ්ලේෂණය කිරීම සඳහා විස්තරාත්මක විශ්ලේෂණ ක්‍රමවේදය භාවිතා කරන අතර ඒ යටතේ ප්‍රස්තාර සටහන්, වගු හා ප්‍රතිශතක අගයන් භාවිතයෙන් දත්ත ඉදිරිපත් කිරීම සිදු කරනු ලැබේ. මෙහි දත්ත විශ්ලේෂණයේ දී Excel හා SPSS යන මෘදුකාංග යොදාගැනුණි.

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ස්ථානගත වීම කෙරෙහි බලපාන සාධක පිළිබඳ ව කරන මෙම අධ්‍යයනයේ අධ්‍යයන ප්‍රදේශය ලෙස ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය නියැදි ප්‍රදේශය ලෙස තෝරාගැනීමට බලපාන ලද හේතු කිහිපයකි.

- නූතන සංවර්ධන ක්‍රියාවලිය තුළ සීඝ්‍රයෙන් ඉහළ ඉලක්ක වෙත ළඟා වෙමින් පවත්නා වූ ප්‍රදේශයක් වීම.
- ස්වභාවික, භෞතික මෙන් ම මානව සම්පත් අතින් ද පොහොසත් ප්‍රදේශයක් වීම.
- අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට වඩා ග්‍රාමීය ගති ලක්ෂණ සැලකීමේ දී ඉතා ඉහළින් දැකිය හැකි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වීම.
- සුවිශේෂී අමුද්‍රව්‍ය පැවතීම නිසා කර්මාන්ත ස්ථානගතවීම සඳහා ඉහළ විභවතාවයක් සහිත ප්‍රදේශයක් වීම.
- නිෂ්පාදන කර්මාන්ත විවිධාංගීකරණයක් පැවතීම.
- තෝරාගත් වසර තුළ අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට වඩා කුඩා කර්මාන්තවල සුවිශේෂී වර්ධනයක් පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් වීම.

අධ්‍යයනය සඳහා අවශ්‍ය ද්විතීයික දත්ත රැස් කිරීමේ දී ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දත්ත, ග්‍රාම සේවා කාර්යාලීය දත්ත, මහ බැංකු වාර්තා, කුඩා කර්මාන්ත හා කර්මාන්ත ස්ථානගත කිරීම සම්බන්ධයෙන් වූ අනෙකුත් පර්යේෂණ ලිපි, සඟරා ආදිය පරිශීලනය කරන ලදි.

## දත්ත විශ්ලේෂණය

ග්‍රාමීය ප්‍රදේශවල කුඩා පරිමාණ නිෂ්පාදන කර්මාන්ත ස්ථාපිත කිරීමේ දී සලකා බලන සාධක හඳුනාගැනීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණක් වන අතර ඒ යටතේ ශ්‍රම සුලභතාවය, භූමි හිමිකාරිත්වය, අමුද්‍රව්‍ය සුලභතාවය, වෙළඳපොළ තත්ත්වය, ප්‍රවාහන ගුණත්වය, කාරක ප්‍රාග්ධනය සපයා ගැනීමේ පහසුව, නිෂ්පාදනය සඳහා යන්ත්‍ර භාවිතය සහ සේවකයින්ගේ දෛනික වැටුප යන සාධකයන් වැදගත් වී ඇත.

ග්‍රාමීය ප්‍රදේශවල කුඩා කර්මාන්ත ස්ථානගත කිරීමේ දී ශ්‍රම සුලභතාවය ග්‍රාමීය අංශයේ කුඩා පරිමාණ කර්මාන්ත සඳහා පුහුණු ශ්‍රමය යොදවා ගැනීමක් සිදු නොවේ. මේ අනුව විධිමත් පුහුණුවකින් තොර ව එනම් පුහුණු පිරිවැයක් දැරීමකින් තොර ව නිෂ්පාදනය සඳහා යොදාගත හැකි හා මෙතෙක් සේවා නියුක්ත නොකරන ලද ශ්‍රමිකයන් විශාල පිරිසක් ග්‍රාමීය අංශය තුළ පැවතීම ග්‍රාමීය ප්‍රදේශවල කර්මාන්ත ස්ථාපිත කිරීමේ පෙළඹුම් සාධකයන් ලෙස හඳුනාගත හැකි ය. එසේම නිෂ්පාදනය සඳහා අවශ්‍ය යෙදවුම් බාධාවකින් තොර ව ලබාගත හැකි වීම නිසා (වැලි, ගල්, ජලය හා පස යනාදි සාධක) යම් ප්‍රමාණයකට පිරිවැය අවම කරගැනීමට අවස්ථා ව සැලසී ඇත. විශේෂයෙන් ම ගොඩනැගිලි නිෂ්පාදන හා පැල තවාන් යන කුඩා කර්මාන්ත හිමියන් කර්මාන්තය ස්ථාපිත කිරීමට පෙර අමුද්‍රව්‍ය සුලභතාවය යන සාධකය සඳහා ඉහළ අවධානයක් යොමු කර ඇති බව පැහැදිලි වේ.

ග්‍රාමීය කුඩා කර්මාන්ත හුදෙකලා කර්මාන්ත ලෙස ස්ථානගත වී තිබීම හේතුවෙන් එක් එක් කර්මාන්තයේ වෙළඳපොළ වපසරිය සාපේක්ෂ ව ඉහළ මට්ටමක පවතී. එහෙයින් ඔවුහු තම නිමවුම් පුළුල් පරාසයකට අලෙවි කරනු ලබති. එසේ අඩු තරඟකාරී බව ග්‍රාමීය ප්‍රදේශවල කුඩා කර්මාන්ත ස්ථාපිත කිරීමේ දී තවත් වැදගත් සාධකයක් ලෙස සැලකිය හැකි ය.

ප්‍රතිඵලවලට අනුව ග්‍රාමීය කර්මාන්ත ආරම්භ කිරිම සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය සපයාගැනීමේ දී ණය ලබාගැනීමේ ප්‍රවණතාවය ඉතා පහළ මට්ටමක පවතී. එනම් පවතින තත්වය පවත්වාගෙන යාම කෙරෙහි ඔවුන් තුළ ඉහළ උනන්දුවක් නොමැත. මේ අනුව පැහැදිලි වන කරුණ නම් ග්‍රාමීය ප්‍රදේශවල කුඩා කර්මාන්ත ස්ථාපිත කිරීමේ ව්‍යාවසායකයන් පොලී පිරිවැය අවම වන අන්දමින් කාරක ප්‍රාග්ධනය සපයාගැනීමට උත්සුක වන බව යි. ග්‍රාමීය ප්‍රදේශවල පවතින ඉහළ සේවා වියුක්තිය හේතුවෙන් මෙම කර්මාන්තකරුවන් ශ්‍රමිකයන් වෙනුවෙන් ගෙවනු ලබන වේතනය සාපේක්ෂ ව පහළ මට්ටමක පවතී. ශ්‍රමිකයන් වෙත ගෙවනු ලබන පොදු වැටුප් තලයට ආසන්න හෝ වැටුප් ලබන පිරිස ඉතා සුළු ප්‍රමාණයක් වේ. මෙම අඩු පිරිවැය ශ්‍රමය කුඩා කර්මාන්ත ආරම්භ කිරීම සඳහා ව්‍යවසායකයන් පොළොඹවන සාධකයක් ලෙස දැක්විය හැකි ය.

දෙවන අරමුණ වන්නේ කුඩා කර්මාන්ත ස්ථානගත වීමේ ප්‍රබල සා දුර්වල සාධක හඳුනාගැනීම යි. භූගෝලීය අවකාශය තුළ යම් නිෂ්පාදන කර්මාන්තයක් ස්ථාපිත කිරීම සඳහා ගනු ලබන තීරණය සාධක රාශියක එකතුවක් මත තීරණය වන්නකි. ඇතැම් විට එම සාධක සියල්ල එක සේ බලපෑම් කරනු වෙනුවට විශේෂිත සාධක කිහිපයක් වැදගත් විය හැකි ය. ලබාගත් නියැදි තොරතුරුවලට අනුව ග්‍රාමීය ප්‍රදේශවල කුඩා කර්මාන්ත ස්ථාපිත කිරීමේ දී ප්‍රවාහන ගුණත්වය, වෙළඳපොළ ඉල්ලුම, භූමි හිමිකාරිත්වය, ප්‍රධාන වෙළඳපොළට ඇති දුර, වැටුප, ශ්‍රම සුලභතාවය, අමුද්‍රව්‍ය සුලභතාවය, කාරක ප්‍රාග්ධනය සපයා ගැනීම යන සාධක පිළිබඳ ඉහළ අවධානයක් යොමු කරනු ලැබී ය. නමුත් අනාගත ප්‍රසාරණ හැකියාව, තරඟකරුවන්ගේ පිහිටීම, නිෂ්පාදනය සඳහා යන්ත්‍ර භාවිතය යන සාධක ග්‍රාමීය අංශයේ කුඩා කර්මාන්ත ස්ථානගත වීම කෙරෙහි ප්‍රබල බලපෑමක් සිදුකර නොමැත.

තෙවන අරමුණ වූයේ කුඩා කර්මාන්තකරුවන් මුහුණ දෙන ගැටළු හඳුනාගැනීම යි. ඒ අතර උපදෙස් ලබාගත නොහැකි වීම, ලියාපදිංචි කිරීමේ ගැටළු, අපද්‍රව්‍ය කළමනාකරණ ගැටළු, ණය ලබාගැනීම දුෂ්කර වීම, ප්‍රාග්ධන සූක්ෂමතාවය, තාක්ෂණික දැනුම නොමැති වීම, ශ්‍රම හිඟය යනාදිය ප්‍රධාන වේ. ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටක කුඩා පරිමාණ නිෂ්පාදන කර්මාන්ත අංශයේ ප්‍රවර්ධනය ආර්ථිකයේ හෙට දවස තීරණය කරන්නක් වන නිසා වේගවත් හා අඛණ්ඩ වර්ධනයක් සඳහා ග්‍රාමීය ප්‍රදේශවල කුඩා කර්මාන්ත සම්බන්ධයෙන් නොවිසඳී පවතින ගැටළු නිරාකරණය කිරීමේ අවශ්‍යතාවය ඉහත ගැටළු දෙස අවධානය යොමු කිරීමේ දි පිළිඹිබු වේ. කුඩා කර්මාන්ත වර්ධනය තුළින් ප්‍රාදේශීය සංවර්ධනය ඇති වී ආර්ථික සංවර්ධනය කරා රටට ගමන් කළ හැකි වේ.

## නිගමන

දත්ත විශ්ලේෂණයට අනුව ග්‍රාමීය ප්‍රදේශවල කුඩා කර්මාන්ත ස්ථාපිත කිරීමේ දී ප්‍රවාහන ගුණත්වය, වෙළඳපොළ ඉල්ලුම, භූමි හිමිකාරිත්වය, ප්‍රධාන වෙළඳපොළට ඇති දුර, වැටුප, ශ්‍රම සුලභතාවය, අමුද්‍රව්‍ය සුලභතාවය, කාරක ප්‍රාග්ධනය සපයා ගැනීම යන සාධක ප්‍රබල බලපෑමක් සිදු කර ඇත. එම සාධකවල බලපෑම මත ග්‍රාමීය ප්‍රදේශවල බහුල ව කර්මාන්ත ස්ථානගත වේ.

අධ්‍යයන ප්‍රදේශය තුළින් ලබාගත් කුඩා කර්මාන්ත නියැදිය තුළ ග්‍රාමීය කුඩා කර්මාන්ත ස්ථානගත වීමේ දී වැඩි පිරිසක් මුහුණපාන ගැටළු ගණනාවක් හඳුනාගත හැකි විය. විවිධ ගැටළුවලට මුහුණ දීමෙන් පැහැදිලි වන කරුණ නම් ග්‍රාමීය කුඩා කර්මාන්ත දිරිගැන්වීම සඳහා ආයතනික වශයෙන් ලබාදෙන සහයෝගය ඉතා අඩු මට්ටමක පවතින බව ය. නමුත් ග්‍රාමීය කුඩා කර්මාන්ත සඳහා ප්‍රාග්ධනය එනම් යන්ත්‍ර භාවිතා කිරීමේ ගැටළුව හා අවශ්‍ය කරන ශ්‍රමය ලබාගැනීම මෙම කර්මාන්ත සඳහා සංරෝධක ලෙස ඉස්මතු වී නොමැති අතර ඊට හේතූන් ලෙස ග්‍රාමීය ප්‍රදේශවල අතිරික්ත ශ්‍රමයක් පැවතීම මෙන් ම අති බහුතරයක් වූ ග්‍රාමීය කුඩා කර්මාන්ත ශ්‍රම සූචක කර්මාන්ත වීම දැක්විය හැකි ය.

කෙසේ නමුත් ග්‍රාමීය ප්‍රදේශවල කුඩා කර්මාන්ත ස්ථානගත වීමේ ඉහළ නැඹුරුතාවක් පවතින අතර කුඩා කර්මාන්ත වර්ධනය තුළින් රටේ සංවර්ධනය ඉහළ යන බව නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පද:** *කර්මාන්ත ස්ථානගත වීමේ සාධක, නිෂ්පාදන කර්මාන්ත, ප්‍රාදේශීය සංවර්ධනය, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත.*

## ආශ්‍රිත ග්‍රන්ථ

Badri, M.A. (2007). Dimensions of Industrial Location Factors. Business and Public Affairs, 1(2). Online] www.scientificjournals.org/journals.2007/articals/1178.pdf.

Deichman, U., Lall, S.V., Redding, S.J. and Veíbles, A.J. (2008).Industrial Location in Developing Countries.*World Bank Research Observer*. Vol. 23, no. 2.[Online] http://elibrary.worldbank.org./doi/abs/10.1093/wbro./ikn007.

Fernandes, A. M. and Sharma, G. (2012).Determinants of Clusters in Indian Manufacturing-The Role of Infrastructure, Governance, Education and Industrial Policy.[Online] http://ideas.repec.org/p/ess/wpaper/id5693.html.